## ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ආධාරක උපකරණ ලබාදීම - 2025

### හැඳින්වීම

දිවයින පුරා විසිර සිටින ශ්‍රවණ සහ අක්ෂි ආබාධ සහිත ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ කායික , මානසික සෞඛ්‍ය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් සෞඛ්‍ය සම්පන්න වැඩිහිටි පිරිසක් අරමුණු කරගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව ශ්‍රවණ උපකරණ, ඇස්කණ්නාඩි, අක්ෂිකාච යන ආධාරක උපකරණ ලබාදීමට කටයුතු කරනු ලැබේ. මෙම වැඩසටහන " පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් " රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි "ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සෞඛ්‍ය සම්පන්න සහ ප්‍රීතිමත් විශ්‍රාම ජීවිතයක්" යටතේ ක්‍රියාත්මක කර ඇත.

වෛද්‍ය උපකරණ ලබා දීම සෞඛ්‍ය අමාත්‍යාංශය හරහාද සිදු කරන නමුත්, එම උපකරණ ලබාදීම් ප්‍රමාණවත් නොවන බැවින්, හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොරොත්තු ලේඛනගත අවස්ථාවල පොරොත්තු ලේඛනයෙන් තොරව උපකරණ ලබාදීම මෙමගින් අපේක්ෂා කෙරේ.

### අරමුණු -

- වැඩිහිටියන් හට අභිමානයෙන් යුත් ජීවන තත්ත්වයක් ලබා දීම.
- ශ්‍රව්‍ය හා දෘශ්‍ය දුර්වලතා නිසා සමාජයෙන් වෙන් වී සිටින වැඩිහිටියාට පෙනීම ලබා දීම තුලින් සමාජයට අනුගත වී තෘප්තිමත් මනා පෞරුෂයකින් යුක්තව සෑදෑ සමයක් ගත කිරීමට හැකියාව සැලසීම.
- රටේ ආර්ථිකයට දායකත්වයක් ලබාදිය හැකි පුරවැසියෙකු බිහිකිරීම.
- සමාජයෙන් හුදෙකලා වී සිටින වැඩිහිටියා සමාජගත කිරීම.

### ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

- ශ්‍රී ලංකාවේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පුරා විසිර සිටින අක්ෂි ආබාධ සහිත සහ ශ්‍රවණ ආබාධ සහිත වයස අවුරුදු 60 ඉක්මවූ සහ අඩුආදායම්ලාභී වැඩිහිටියන් හා වැඩිහිටි නිවාසගත වැඩිහිටියන් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

- 2025 වර්ෂයට අදාළ අයදුම්පත් මඟින් වැඩිහිටියාගේ තොරතුරු නිවැරදිව ලබා ගත යුතුය.

- ශ්‍රවණ උපකරණ ඉල්ලීම් කරනු ලබන සෑම අයදුම්කරුවකු විසින්ම ශ්‍රවණ උපකරණ පැලදීමේ අවශ්‍යතා ඇති අයෙකු බවට අයදුම්පත්‍රයෙහි සඳහන් පරිදි රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් වෛද්‍ය නිර්දේශය ලබා ගැනීම කල යුතු අතර, ප්‍රතිලාභියාගේ කන සම්බන්ධව ලබා ගන්නා වෛද්‍ය වාර්තාව (AUDIOMETRY ) ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

- ඇස් කණ්නාඩි , අක්ෂි කාච, ශ්‍රවණ උපකරණ ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් විසින් අයදුම්පතෙහි ශ්‍රවණ උපකරණ ඇස් කණ්නාඩි ( BIFOCAL ) අක්ෂි කාච පැලදීමේ අවශ්‍යතා ඇති අයෙකු බවට අයදුම්පත්‍රයෙහි සඳහන් පරිදි රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් වෛද්‍ය නිර්දේශය ලබා ගැනීම කල යුතුය.

- අදාල අයදුම්කරු සුදුස්සෙකු බවට අයදුම්පතෙහි ග්‍රාම නිලධාරි හා වැඩිහිටි විෂය සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරි විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කර තිබිය යුතුය.

- නිවැරදිව සම්පූර්ණ කර එවන ලද අයදුම්පත් හා ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයට අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී පුමුඛතාවය අනුව සකස්කල ප්‍රතිලාභීන්ගේ ලේඛනයක්ද සමඟ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව අධ්‍යක්ෂගේ අනුමැතියට ඉදිරිපත් කල යුතුය. ( ඇමුණුම 01 මඟින් දක්වා ඇත. )

- ශ්‍රවණ උපකරණ / ඇස් කණ්නාඩි සකස් කිරීමෙන් පසු හා අක්ෂි කාච මිළදී ගැනීමෙන් පසුව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දීමට කටයුතු කෙරේ.

<u>**අධීක්ෂණය හා පසුවිපරම**</u>

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමුකරන ලද ශ්‍රවණ උපකරණ /ඇස් කණ්නාඩි/අක්ෂි කාච අදාල ප්‍රතිලාභියාට භාරදීමෙන් පසුව ප්‍රතිලාභීන් ලබාගත් බවට සනාථ කෙරෙන අත්සන් ලේඛන ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයට එවිය යුතුය. එසේම ඇමුණුම 02 ආකෘතිය මඟින් අක්ෂි ශල්‍ය කර්ම සිදු කිරීමෙන් අනතුරුව ප්‍රතිලාභියාගේ තොරතුරු ඇතුලත් වාර්තාව වෛද්‍යවරයා ලවා සම්පූර්ණ කොට නිලධාරියා විසින් ඉදිරි කටයුතු සඳහා, ප්‍රාදේශීය ලේකම් මඟින් වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත එවිය යුතුය.

- ශ්‍රවණ උපකරණ / ඇස් කණ්නාඩි ලබාදීමෙන් පසුව එම උපකරණ සම්බන්ධයෙන් සිදුවන අළුත්වැඩියා /ගැටළු හා අනෙකුත් අවශ්‍යතා සඳහා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂයභාර නිලධාරියා විසින් ආයතනය සම්බන්ධීකරණය කර ප්‍රතිලාභියා අදාල ආයතනය වෙත යොමු කල යුතුය.

කේ. චතුර මිහිඳුම
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය